**ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය - 2012**

**----------------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**------------------------------**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**----------------------------------------**

#### 1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

**----------------------------------------**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව වාර්තාකරණ දිනයෙන් පසු සාධාරණ කාලපරිච්ඡේදයක් තුළදී ඒවා පරිශීලකයන්ට ලබා නොදෙන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ප්‍රයෝජනවත්භාවය හානිකරණයට භාජනය වන බවත් වාර්තාකරණ දිනයෙන් මාස 06 ක කාලයක් තුලදී එහි මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමේ හැකියාව ආයතනයට තිබිය යුතු බවත් දක්වා ඇත. එසේ වුවද 2013, 2014 හා 2015 වර්ෂවල මූල්‍ය ප්‍රකාශන 2016 සැප්තැම්බර් 30 දින දක්වාත් ඉදිරිපත් කර නොතිබුණි.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

**----------------------**

රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන යටතේ කරනු ලබන වියදම් ප්‍රදාන ගිණුමෙන් සමුච්චිත අරමුදලට මාරු කිරීම මණ්ඩලයේ ප්‍රතිපත්තිය වුවද 2008 වර්ෂයට අදාල රු.7,295,549 ක වියදම ඉහත පරිදි සමුච්චිත අරමුදලට මාරුකර නොතිබුණි. මෙයට අතිරේකව 2008 වර්ෂයේ රු.6,900,000 ක ප්‍රාග්ධන ලැබීම් දෙවරක් සටහන් වී ඇතිබව සලකා එය නිවැරදි කිරීම සිදුකර තිබූ නමුත් එවැනි වරදක් සිදුවී නොතිබූ බව විගණන පරීක්ෂණයේදී අනාවරණය විය. සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා මෙම වැරදි නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

1.2.3 **පැහැදිලි නොකළ වෙනස්කම්**

-------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් හා වගකීම් විෂයයන් 11 ක් ඊට අදාල ලේඛන හා වාර්තා සමඟ සැසඳීමේදී රු. 9,730,938 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3 **ගෙවිය යුතු ගිණුම්**

-------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1991 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ගෙවිය යුතු රු.701,110 ක විගණන ගාස්තු නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2007 වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර දේශීය ආදායම් කොමසාරිස්ට ප්‍රේෂණය කළයුතු රු.87,550 ක් වූ බදු මුදල් 2015 දෙසැම්බර් 31 දින දක්වාම දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

1.4 **නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

----------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති හා රෙගුලාසිවලට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 11 පරිශිෂ්ඨය හා 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009(2) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව හා නිවැරදිව පවත්වාගෙන ගොස් නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2009 සැප්තැම්බර් 01 දිනැති අංක DMA/2009 (2) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | පිරිවැය එකතුව රු. 217,748,020 ක් වූ ස්ථාවර වත්කම් හා පිරිවැය එකතුව රු.2,301,165 ක් වූ තොගය සම්බන්ධ 2012 දෙසැම්බර් 31 දිනට වත්කම් සත්‍යාපනය සිදුකර නොතිබුණි. |
| (ඇ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධ ලේඛනයක් පවත්වා නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු.11,579,955 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.14,129,348 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,549,393 ක ඌනතාවයේ අඩුවීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ වියදම රු.7,780,514 කින් වැඩිවුවද ආදායම රු.9,790,586 කින් වැඩිවීම ඉහත ඌනතාවය අඩුවීමට හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

### 3.1 කළමනාකරණ ක්‍රියාකාරකම්

-----------------------------

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය පිහිටි ඉඩම නිදහස් ප්‍රදානයක් වශයෙන් පවරා දීම 2015 ජුලි 08 දින අමාත්‍ය මණ්ඩලය අනුමත කර තිබූ බැවින් ඒ සම්බන්ධව පවරා දීමේ කටයුතු කරදෙන ලෙස තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් විසින් නිර්දේශ කර පළාත් ඉඩම් කොමසාරිස්ට ඉදිරිපත් කර තිබුණි. නමුත් විගණිත දිනය වූ 2016 අප්‍රේල් 30 වනවිටත් පවරා දී නොතිබුණි.

**4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**-------------------------------------**

4.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**-------------------------------**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය පරිදි ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත අදාල වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත්කළ යුතු වුවත් 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වසර තුනක් ප්‍රමාද කර 2016 පෙබරවාරි 11 දින ඉදිරිපත් කර තිබුණි.

4.2 **අයවැය ලේඛනමය පාලනය**

**-----------------------------**

අයවැයගත හා තත්‍ය ආදායම් හා වියදම් අතර සියයට 25 සිට සියයට 100 ක් අතර පරාසයක් තුළ සැලකිය යුතු විචලනයන් වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. **පද්ධති හා පාලනයන්**

**---------------------**

විගණනයේ දී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) අත්තිකාරම් පාලනය

(ඇ) තොග පාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) ලැබිය යුතු ගිණුම් හා ගෙවිය යුතු ගිණුම්